# විවිධ ක්ෂේත්‍ර අතර ඇති පොදු බව

බොහෝ දෙනාට විද්‍යාව යනු සදාචාරයෙන් වෙන් වූවකි. ඔවුන්ගේ ලෝකවල විද්‍යාව එක් තැනක ය. දේශපාලනය තවත් තැනක ය. සාහිත්‍යය ඒ දෙකෙන් ම ඈත් වී ය. සුචරිතය තීරණය කෙරෙන්නේ විද්‍යාවෙන් හා අනෙක් ක්ෂේත්‍රවලින් බාහිරව ය. ඇතැමුන් විද්‍යාවට ආචාරධර්ම බාහිරින් එකතුකිරීමට වෑයම්කරනු පෙනෙයි. එහෙත් මේ අය තේරුම් නොගන්නා කරුණ නම් මේ සියල්ල අතර යම් පොදුබවක් ඇති බව ය. මේ කරුණ අප සෑහෙන කලක් තිස්සේ කියන නමුත් ඒ තේරුම්ගෙන ඇති පිරිස අල්ප බව කිව යුතු ය.

මගේ ලෝකය කෘතිය පළමුවරට මුද්‍රණය කෙරී අවුරුදු විස්සක් ගත වී ඇති නමුත් එහි ඉදිරිපත්කෙරී ඇති නව දැනුම කුමක් දැයි සොයා බැලීමට වෙහෙසුනෝ ඉතා ටික දෙනෙක් වූහ. එයට ප්‍රධාන හේතුව සිංහලයෙන් අළුත් දැනුමක් ඉදිරිපත් කෙරෙන්නේ නැත යනුවෙන් බොහෝ උගතුන් අතර ඇති පිළිගැනීම ය. සාහිත්‍ය කලා නිර්මාණ හැරෙන්නට වෙනත් නිර්මාණ ගැන බොහෝ දෙනා නො දනිති. ඔවුන් සිතන්නේ දැනුම යනු විශිෂ්ට පුද්ගලයන් විසින් සොයාගනු ලැබෙන්නක් බව ය. මේ විශිෂ්ටයන් සිංහලයන් නොවිය හැකි යැයි ද ඔවුහු සිතති. ඔවුන්ට අනුව සිංහල උගතුන්ගේ කාර්යභාරය බටහිර ඇති දැනුමක් සිංහල පාඨකයන් යැයි කියන්නන්ට හඳුන්වාදීම ය. එබැවින් සිංහලෙන් ලියැවෙන පොතපත මේ උගතුන් කියවන්නේ එසේ සිංහල පාඨකයා නමැත්තාට හඳුන්වා දී ඇති බටහිර දැනුම කුමක් දැයි දැනගැනීමට මිස කතුවරයාගේ ස්වාධීන අදහසක් (නිර්මාණයක් - අවශ්‍ය නම් සොයාගැනීමක්) දැනගැනීමට නොවේ. අප විසින් නිරාමාණය කෙරී ඇති අදහස්වලට ද උගතුන්ගෙන් කලාතුරකින් ප්‍රතිචාරයක් ලැබිණි නම් එය ද එලෙස සිංහල පාඨකයාට හඳුන්වා දී ඇතැයි කියන දැනුමක් සම්බන්ධයෙන් විය.

අපේ අදහස් නිර්මාණයට බටහිර දැනුමේ ආභාසය නොලැබුණා නොවේ. බටහිර සමාජ විද්‍යාඥයන් කලක සිට කියන කරුණු දෙකක් එහි දී වැදගත් විණි. එකක් දැනුම යනු සමාජ නිර්මිතයක් බව ය. ඉන් කියැවෙන්නේ දැනුම සමාජය විසින් ඒ ඒ කාලයෙහි දී නිර්මාණය කෙරෙන්නක් බව ය. අනෙක් කරුන වූයේ දැනුමේ සාපේක්ෂ බව ය. වාස්තවික වූ දැනුමක් නොමැති බව ඉන් කියැවිණි. මෙහි එක් නිගමනයක් වූයේ ඒ ඒ කාලවල දී නිර්මාණය කෙරෙන දැනුම් එක මිම්මෙන් මැනිය නො හැකි (අසම්මේය - incommensurable) බව ය.

උදාහරණයක් ලෙස ගතහොත් කෙප්ලර් විද්වතා සූර්යයා වටේ ග්‍රහවස්තු ඉලිප්සාකාර පථවල චලනයවන බව කියා සිටියේ ය. නිව්ටන් විද්වතා ද ඒ බව කීවේ ය. එහෙත් ඒ දෙදෙනාගේ දැනුම් අසම්මේය වෙයි. එයට වැදගත් හේතුවක් වෙයි. නිව්ටන් පඬිවරයා ග්‍රහවස්තු දුටුවේ ගුරුත්වාකර්ෂණ බලයක් සමගින් ය. එහෙත් කෙප්ලර් පඬිවරයාට ගුරුත්වාකර්ෂණයක් නො වී ය. එබැවින් ඒ දැනුම් එකම මිම්මෙන් මැනිය හැකි නො වේ.

බටහිර විද්‍යාවට සුසමාදර්ශ (paradigme) ගණනාවක් ඇති බවත් දැනුම නිර්මාණයවන්නේ ඒ ඒ සුසමාදර්ශයෙහි බවත් බටහිර විද්‍යාව පිළිබඳ දාර්ශනිකයෝ කියා සිටියහ. ඉහත සඳහන් අදහස් පළකළවුන් අතර වූ තෝමස් කුන් හා පෝල් ෆෙයරාබන්ඩ් පඬිවරු විශේෂයෙන් ම අප කෙරෙහි බලපෑමක් ඇතිකළහ. මේ අතර කියැවුණු තවත් කරුණක් වූයේ බටහිර විද්‍යාවට යම් දෘෂ්ටියක් ඇති බව ය. මේ සියළු අදහස් අප අතින් වර්ධනය විය. එහි ප්‍රතිඵලය වූයේ නවතම ඥානවිභායක් ද බිහිවීම (නිර්මාණය වීම) ය. ඒ ඥාන විභාගය නිර්මාණයකිරීමේ දී අපට මාධ්‍යමිකවාදය ඇරඹූ නාගර්ජුනපාදයන් වහන්සේගේ ආභාසය ද ලැබිණි. නව ඥානවිභාගය නිර්මාණාත්මක සාපේක්ෂකවාදය ලෙස හැඳින්වෙයි.

එහෙත් මෙයින් කියැවෙන්නේ අප බටහිර සමාජ විද්‍යාඥයන්, විද්‍යාවේ දාර්ශනිකයන් හා මාධ්‍යමිකවාදීන් (මහායානිකයන් - නාගර්ජුනපාදයන් වහන්සේ මහායානිකයකු නොවේ යැයි කීමට ඇතැම් බෞද්ධ පඬිවරුන්ට අවශ්‍ය වුව ද අපට එවැනි වුවමනාවක් නො වේ.) අනුකරණය කළ බවක් නො වෙයි. අප විසින් කර ඇත්තේ ඒ දැනුම් සිංහල ථෙරවාද සංස්කෘතියට අවශෝෂණයකර නව දැනුමක් නිර්මාණයකිරීම ය. එහි දී අපට ගුණදාස අමරසේකර මහතා යොදාගත් ජාතික චින්තනය යන අදහස ද වැදගත් විය.

© Prof. Nalin De Silva

අමරසේකර මහතාට මුල දී ජාතික චින්තනය යන්න නැෂනල් තෝට් (national thought) යන වදන්වල පරිවර්තනයක් පමණක් විය. රුසියන් විප්ලවය ගැන ලියූ එක් අයකු ලෙනින් මහතා සාර්ථක වූයේ ඔහු රුසියන් ජාතික චින්තනය සැලකිල්ලට ගත් නිසා යැයි ද ඔහුගේ ජයග්‍රහණය රුසියන් ජාතික චින්තනයේ ජයග්‍රහණයක් යැයි ද සඳහන්කර තිබුණි. අමරසේකර මහතා මෙරට මාක්ස්වාදීන් විවේචනය කෙළේ ඔවුන් මෙරට ජාතික චින්තනය සැලකිල්ලට නොගත් බව පවසමිනි. ඔහුට මුල දී අවශ්‍ය වූයේ මාක්ස්වාදය ජාතික චින්තනයේ දර්ශනය බවට පත්කර ගැනීමට ය. එහෙත් මේ ජාතික චින්තනය කුමක් දැයි විස්තරකරන ලෙස මෙරට අටුවන් බැහැපු මාක්ස්වාදීන් අභියෝග කළවිට එයට සාර්ථක පිළිතුරක් දීගත නො හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ චින්තනය යන්නට නව අර්ථකථනයක් ලබා දී එය අප විසින් වර්ධනය කෙරෙමින් තිබූ ඥානවිභාගයෙහි දී යොදාගැනීම ය.

චින්තනය යන්න මගේ ලෝකය කෘතියෙහි විස්තර කෙරී ඇත. එයට ඥානවිභාගයක් (epistemology) න්‍යායක් (logic) ආකල්ප ආදිය වෙයි. එක් එක් රටවල ජනයා ගේ ආකල්ප විවිධ වෙයි. සියළු ජනයාට පොදු වූ ඥානවිභාගයක් නැත. ඇතැම්හු ඇරිස්ටෝටලීය ද්විකෝටික රූපික න්‍යාය යොදාගනිති. තවත් අයෙක් චතුස්කෝටික න්‍යාය භාවිතාකරති. ඇතැමුන්ගේ ආකල්ප අනුව ලෝකය මවා හෝ මැවී හෝ ඇත්තේ මිනිසා වෙනුවෙන් ය. වෙනත් අය ලෝකය සමග සහජීවනයෙන් ජීවත්වීමට අදහස්කරති. පෙරදිග ඥානවිභාගය සත්බවෙන් (ontology) වෙන් නො වෙයි. ලෝකය යනු කුමක් ද යන ප්‍රශ්නයට මෙන් ම ලෝකය වාස්තවික යථාර්ථයක් ලෙස පවතින්නේ ද යන්නට ද විවිධ ජාතීන් විවිධ පිළිතුරු දී ඇත. එක් එක් ජාතිය හෝ ජනවර්ගය හෝ සතු මේ සියල්ලෙහි සමුච්චය ඒ ඒ ජාතියෙහි හෝ ජනවර්ගයෙහි හෝ ජාතික චින්තනය වෙයි.

මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. කිසිම ජාතික චින්තනයක් වෙනස් නොවී ස්ථිතික ව නො පවතියි. ඒ ඒ ජාතියෙහි හෝ ජනවර්ගයෙහි හෝ චින්තනය ද වෙනස් වෙයි. ඇතැම් විට එසේ වෙනස්වන්නේ ආකල්ප වෙනස්වීම නිසා විය හැකි ය. එසේත් නැත්නම් ඥාන විභාගයේ වෙනස්වීමක් නිසා හෝ න්‍යායේ වෙනසක් නිසා චින්තනය වෙනස්විය හැකි ය. ඇතැම් විට ඒ එක් අංගයකට වඩා වෙනස්වනවා විය හැකි ය.

අපේ චින්තනයේ එක් අංගයක් ලෙස අප ගොඩනගා ඇති ඥානවිභාගයට අනුව මිනිස්සු සිය ඉන්ද්‍රිය පද්ධතියට, මනසට, සංස්කෘතියට සාපේක්ෂව යම් චින්තනයක දැනුම නිර්මාණය කරති. බටහිරයන් දැනුම යනු සමාජ නිර්මිතයක් යැයි කියන විට අප එයට වඩා පළල්ව කියන්නේ දැනුම චින්තනයක නිර්මාණය කෙරෙන බවත් එය ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂව කෙරෙන බවත් ය. ඒ කරුණ බටහිරයන් කියන්නක් නො වෙයි. මෙලෙස දැනුම නිර්මාණය කෙරෙන බැවින් ඒ ඒ සමාජයෙහි නිර්මාණය කෙරෙන දැනුම් ද වෙනස් බව අපි කියමු. ඒ විවිධ දැනුම් අසම්මේය බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ලෝකය යන්න ද මිනිසුන්ගේ නිර්මාණයකි. විද්‍යාව යනුවෙන් සියල්ලන්ට පොදු වූ විද්‍යාවක් නොමැති බව අපි නොයෙක් අවස්ථාවල පෙන්වා දී ඇත්තෙමු. ලෝකය යනු ලෝකය පිළිබඳ අප විසින් ගොඩනගාගනු ලැබ ඇති දැනුම වෙයි.

අපේ ඥානවිභාගයට අනුව ලෝකය ඒ පිළිබඳ දැනුමෙන් වෙන්කළ හැකි නො වෙයි. අපි දැනුම නිර්මාණය කරමු. ඥානවිභාගය ද යනු දැනුමෙහි ම කොටසක් වෙයි. එසේ නම් අපි ඥානවිභාගය ද නිර්මාණය කරමු. ඒ අතර ආකල්ප මෙන් ම න්‍යාය ද නිරාමාණය කරනු ලබන්නේ අප විසින් ය. මෙහි චක්‍රීය භාවයක් වෙයි. එහෙත් අපේ චින්තනයෙහි චක්‍රිය භාවය ද අඩංගු වෙයි. එබැවින් අපට එහි ගැටළුවක් තිබිය හැකි නො වෙයි. එහෙත් රේඛීය චින්තනයක් ඇති අයකුට මෙහි ඇත්තේ විසංවාදයකි.

අපේ ඥානවිභාගයට අනුව දැනුම යම් චින්තනයක ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය වන බැවින් ඒ ඒ චින්තනයෙහි ගොඩනැගෙන දැනුම් අතර යම් සම්බන්ධයක් වෙයි. අප විද්‍යාව දර්ශනයෙන්වත්, දර්ශනය සමාජ විද්‍යාවෙන්වත් මුළුමනින් ම වෙන් නොකරන්නේ එබැවිනි. චින්තනයක නොව එකම සුසමාදර්ශයක නිර්මාණය කෙරෙන දැනුම් අතරත් සම්බන්ධයක් වෙයි. බටහිර විද්‍යාවේ අද ද ප්‍රධාන සුසමාදර්ශය වනුයේ නිව්ටෝනීය සුසමාදර්ශය ය. අවුරුදු සියයකට වැඩි කාලයක් පැවතීමෙන් පසුවත් අයින්ස්ටයිනීය සුසමාදර්ශයට නිව්ටෝනීය සුසමාදර්ශය පරාජයකිරීමට නොහැකි වී ඇත. එයට හේතුව නිව්ටෝනීය සුසමාදර්ශය බටහිර නූතනත්වයෙහි සුසමාදර්ශය වීම ය.

© Prof. Nalin De Silva

නිව්ටෝනීය සුසමාදර්ශය මත පදනම් ව බිහි වී ඇත්තේ නිව්ටෝනීය යාන්ත්‍රිකය පමණක් නො වෙයි. අද පවත්නා බටහිර රසායනය, ජෛවීය විද්‍යා පමණක් නොව සමාජයීය විද්‍යාවන් හා සදාචාරය ද නිව්ටෝනීය සුසමාදර්ශය පදනම් කෙරී බිහි වී ඇත. නිව්ටෝනීය සුසමාදර්ශයෙහි බිහිකෙරෙන විවිධ ප්‍රවාද සංකල්ප ආදිය අතර සම්බන්ධයක් තිබිය යුතු බව ඉහත සඳහන් කරුණුවලින් පෙනී යා යුතු ය. එසේ නම් එයට වඩා පළල් සංකල්පයක් වූ චින්තනය ගැන කිවහැක්කේ කුමක් ද? කිනම් ක්ෂෙත්‍රයකට අයත් වුව ද, යම් චින්තනයක බිහිකෙරෙන ප්‍රවාද හා සංකල්ප ආදිය, අතර සම්බන්ධයක් පවතියි. අපට විද්‍යාව, දර්ශනයෙන් සංගීතයෙන් ආදී වශයෙන් මුළුමනින් ම වෙන්කර දැක්වීම අසීරු කටයුත්තක් වෙයි.

තවත් වැදගත් කරුණක් ඉතිරි වී ඇත. අප දැනුම නිර්මාණය කරන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් දිය යුතු ව ඇත. එයට අප දෙන පිළිතුර ඇතැම්හු දනිති. අප දැනුම් නිර්මාණය කරන්නේ අපේ අවිද්‍යාව නිසා ය. ඒ කිනම් අවිද්‍යාවක් වේ ද? ඒ අන් කිසිවක් නොව අනිත්‍ය, දුඃඛ අනත්ත පිළිබඳ නො දැනුම ය. අප එය ලබාගන්නේ පටිච්ච සමුප්පාදය ඇසුරෙන් ය. ඇතැම් බෞද්ධයන් අප සමග එකඟ නොවනු ඇත. අනිත්‍ය දුඃඛ අනත්ත පිළිබඳ නොදැනුම නිසා අපි දැනුම නිර්මාණය කරමු. මේ ඇතැම් කරුණු බටහිරයන්ගේ පොතපතෙහි සඳහන් නො වෙයි. දැනුම පිළිබඳ ව, දැනුම් නිර්මාණය කිරීම පිළිබඳ ව අපි යම් දැනුමක් නිර්මාණය කෙළෙමු. බටහිර විද්‍යාව ගැන කතාකරන අතර සුචරිතය ගැන ද අප කතාකරන්නේ අද ඒ සියල්ල බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිර්මාණය කෙරී ඒ අතර යම් පොදු බවක් දැකිය හැකි බැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva